**ශීර්ෂය 214 - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**

## 1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

### 1.1 දැක්ම

සමස්ථ ලෝක ප්‍රවණතාවන් සමඟ යමින් ජාතියේ අවශ්‍යතාවයන් සහ අපේක්ෂාවන්ට උචිත වන ආකාරයේ උසස්ම තත්ත්වයේ විශ්වවිද්‍යාල පද්ධතියක් ගොඩනැගීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැක්මයි .

### 1.2 මෙහෙවර

උසස් අධ්‍යාපනය සම්බන්ධ උනන්දුවක් දක්වන පාර්ශව සමග සම්බන්ධ වී ජාතික සහ ගෝලීය අවශ්‍යතාවයන්ට සරිලන පරිදි අධ්‍යයන පාඨමාලාවන්ගේ විවිධත්වය, ප්‍රමිතිය සහ එහි ගුණාත්මකභාවය පවත්වාගෙනයාම සහ අදාළත්වය සහතික කිරීම තුළින් ප්‍රශස්ථ මට්ටමේ ඉගැන්වීමේ, පර්යේෂණ පැවැත්වීමේ නව සොයාගැනීම් සහ ගෝලීය මට්ටමේ සේවාවන්හි නිරත විශිෂ්ඨත්වයේ මධ්‍යස්ථාන ජාලයක් බවට උසස් අධ්‍යාපන පද්ධතිය පත්කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ලබාදෙමින්, පෝෂණය කරමින් සහ/ හෝ පහසුකම් සලසමින් රටේ අවශ්‍යතාවන්ට අදාළවන ඉහළම මට්ටමේ ඉගෙනීම, පර්යේෂණ පැවැත්වීම සහ නව්‍යකරණය වෙත කැපවුණු සහ මහජනයාට වගකිව හැකි ආකාරයේ, පුළුල් පිළිගැනීමක් සහ වැඩි ඉඩ ප්‍රස්ථාවක් සහිත උසස් අධ්‍යාපන පද්ධතියක්, අවශ්‍ය සම්පත් වෙන්කිරීම සහ යහපත් පාලනය සහ කළමනාකරණය තුළින් ස්ථාපිත කර නිසි මග පෙන්වීමක් ඔස්සේ, සංවර්ධනය කොට පවත්වාගෙන යෑම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මෙහෙවරයි.

### 1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීම.

## 2. මුළු ප්‍රතිපාදනය හා වියදම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.61,564,000,000ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.58,017,056,000 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.3,546,944,000 ක් හෙවත් සියයට 5.76 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2022 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 56,864,000,000 | 54,974,913,000 | 1,889,087,000 | 3.32 |
| මූලධන | 4,700,000,000 | 3,042,143,000 | 1,657,857,000 | 35.27 |
| එකතුව | 61,564,000,000 | 58,017,056,000 | 3,546,944,000 | 5.76 |

## 3. විගණන නිරීක්ෂණය

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කොමිෂන් සභා වැය ශීර්ෂය යටතේ ගිණුම්ගත කර විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වෙත ලබා දී තිබු අතර එම ආයතන විසින් එම ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. එම විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල අවසන් ගිණුම් විගණනය කර ඒ පිළිබඳ වාර්තා යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.